# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

**14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.19 පැය 1950 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 94 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**මන්නාරම ද්විත්ව මනුෂ්‍ය ඝාතන සිද්ධියට අදාලව සැකකරුවන් අත්අඩංගුවට ගැනීම.**

2025.01.16 වන දින මන්නාරම පොලිස් වසමේ මන්නාරම ගරු මහේස්ත්‍රාත් අධිකරණය ආසන්නයේදී, යතුරු පැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් සිදු කළ වෙඩි තැබීමකින් කාන්තාවක් හා පුද්ගලයෙකු මියගොස් තවත් පුද්ගලයින් දෙදෙනෙකු තුවාල ලැබීමේ සිද්ධියේ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් කණ්ඩායම් කිහිපයක් විමර්ශන ආරම්භ කර තිබුණි.

2025.01.18 වන දින පේසාලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පේසාලේ ප්‍රදේශයේදී, මන්නාරම වෙඩි තැබීමේ සිද්ධියට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා මන්නාරම පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන කයිකාවල, මාතලේ ප්‍රදේශයේ පදිංචි විශ්‍රාමික යුධ හමුදා සැරයන්වරයෙකු වන අතර මොහු කැලණිය ප්‍රදේශයේ තාවකාලිකව පදිංචිව සිට ඇත.**

මෙම සැකකරු සම්බන්ධයෙන් සිදු කල වැඩිදුර විමර්ශනයේදී, 2023.08.24 වන දින අඩම්පන් පොලිස් වසමේ මොල්ලිකණ්ඩාල් ප්‍රදේශයේදී පිස්තෝල අවියකින් වෙඩි තබා ද්විත්ව මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ අපරාධයේ ප්‍රධාන සැකකරු බවටද අනාවරණය වී ඇත.

2025.01.18 වන දින මඩු පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් දෙමටගොඩ ප්‍රදේශයේදී මන්නාරම වෙඩි තැබීමේ සිද්ධියේ ප්‍රධාන සැකකරු හා කැලණිය ප්‍රදේශයේදී අඩම්පන් වෙඩි තැබීමේ සිද්ධියට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර සැකකරුවන් දෙදෙනා වැඩිදුර විමර්ශන සඳහා මන්නාරම පොලිස් ස්ථානයට භාර දී ඇත.

**මන්නාරම වෙඩි තැබීමේ සිද්ධියට අදාලව අත්අඩංගුවට ගත් ප්‍රධාන සැකකරු වයස අවුරුදු 34 ක් වන අමන්දොළුව, සීදූව ප්‍රදේශයේ පදිංචි නාරාහේන්පිට යුධ හමුදා රෝහලේ වෛද්‍ය සහයකයෙකු ලෙස සේවය කරන අයෙකි.**

**අඩම්පන් වෙඩි තැබීමේ සිද්ධියේ ආධාර අනුබල දීමට අදාලව අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වූ මාලිගාවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මන්නාරම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**